# දෙවියන් වහන්සේ හා නිරීක්ෂකයෝ

ලෝකය පවතින්නේ ය යන්න කාගේ හෝ කිසිවක හෝ දැනුමක් නොවී ලෝකය පවතින්නේ ය යනුවෙන් කී කල්හි ද එසේ ප්‍රකාශකෙරෙන්නේ දැනුමකි. එසේ දැනුමක් නොවන ප්‍රකාශයක් ලෝකයේ පැවැත්ම පිළිබඳ ව කරන්නේ කෙසේ ද? සත්බව යන්න දැනුමක් වෙයි. ලෝකය පවතින්නේ ය යන්න මිනිසකුගේ (මිනිස් නිරීක්ෂකයකුගේ) දැනුමක් නොවී ලෝකය පැවතිය හැකි ය යන්න ද දැනුමක් වෙයි. ඒ දැනුම මිනිසුන්ට ඇතැයි ගතහොත් ඉන් කියැවෙන්නේ මිනිසකුගේ දැනුමක් නොවී ලෝකය පැවතිය හැකිය යන්න මිනිසුන්ගේ දැනුමක් විය හැකි බව ය. වෙනත් වචනවලින් කිවහොත් මිනිසුන්ගේ දැනුමක් නොවී ලෝකය පැවතිය හැකි ය යන්න මිනිසුන්ගේ දැනුමක් වෙයි. එහෙත් මිනිසුන් ඒ දැනුම ලබාගන්නේ කෙසේ ද? ඒ දැනුම වාස්තවිකව, එනම් මිනිසුන්ගෙන් ස්වායත්තව ප්‍රකාශ කළ හැකි ද?

මෙහි දී ප්‍රශ්නය වනුයේ වාස්තවිකව, එනම් මිනිසුන්ගේ හෝ වෙනත් නිරීක්ෂකයන්ගෙන් හෝ ස්වායත්තව ලෝකය පැවතිය හැකි ද යන්න හා එසේ පවතින බව නිරීක්ෂකයන්ගෙන් ස්වායත්තව ප්‍රකාශ කරන්නේ කෙසේ ද යන්න ය. ඕනෑම දැනුමක් ප්‍රස්තුතයක්, ප්‍රකාශයක් මගින් ප්‍රකාශකරනු ලබන්නේ සත්ත්වයකු (නිරීක්ෂකයකු) විසින් ය. අප කෙතෙක් උත්සාහ ගත්ත ද අපට ඉන් බැහැර විය නො හැකි ය. ඉන් කියැවෙන්නේ දැනුමක්, (එය ලෝකයේ පැවැත්ම පිළිබඳව විය හැකි ය, නැත්නම් ඉර පායා ඇත වැනි දෙයක් විය හැකි ය) නිරීක්ෂකයකුගෙන් තොරව ප්‍රකාශකළ නො හැකි ය යන්න ය. දැනුම ප්‍රකාශකිරීම අවශ්‍ය දැයි මෙහි දී යමකුට ප්‍රශ්නකළ හැකි ය. ප්‍රකාශ නොකර දැනුම පැවතිය නොහැකි ද යන්න මේ ප්‍රශ්නයේ පදනමේ වෙයි. දැනුම ප්‍රකාශකිරීම අවශ්‍ය නො වෙයි. එහෙත් දැනුම ප්‍රකාශ නොකළ ද එය කාහට හෝ තිබිය යුතු ය. එහි තේරුම නම් දැනුම අඩුම තරමින් යමකු විසින් තමාටම ප්‍රකාශකර ගනු ලබන්නේ ය යන්න ය. මෙහි දී දැනුම ප්‍රකාශකිරීමට භාෂාවක් අනිවාර්යයෙන් ම තිබීම අනවශ්‍ය වෙයි. යමකුට තමාටම යමක් සන්නිවේදනය කිරීමට භාෂාවක් අවශ්‍ය නො වෙයි. එහි දී අවශ්‍යවන්නේ යමකු සවිඥානික වීම ය. යමකු යමක් ගැන සවිඥානික වීම යනු යමකුට ඒ දෙය පිළිබඳ දැනුමක් තිබීම ය.

මෙයින් පැහැදිලිවන්නේ දැනුම පිළිබඳ ප්‍රශ්නයෙහි දී අපට සවිඥානික නිරීක්ෂකයා මගහැර යෑමට නොහැකි බව ය. යමකු යමක් පිළිබඳ දැනුවත් වීම යනු ඒ පිළිබඳ සවිඥානික වීම ය. දැනුමක් ඇත්තේ සවිඥානික නිරීක්ෂකයකුට ය. සවිඥානික නිරීක්ෂකයන්ගෙන් තොරව දැනුමක් පැවතිය හැකි ය යන්න ද සවිඥානික නිරීක්ෂකයන් පිරිසකගේ දැනුමක් බව පැහැදිලි විය යුතු ය. එබැවින් ලෝකය පවතින්නේ ය යන්න ද කාගේ හෝ දැනුමක් වෙයි. මිනිසුන්ගෙන් තොරව ලෝකය පවතින්නේ ය යන්න යම් මිනිස් නිරීක්ෂකයන් පිරිසකගේ දැනුමක් වනවා පමණක් නො වෙයි. ලෝකය පවතින්නේ ය යන්න ද කාගේ හෝ දැනුමක් වෙයි. වාස්තවික යථාර්ථවාදීන්, ද්‍රව්‍යවාදීන්, භෞතිකවාදීන් ආදී වශයෙන් තමන් හඳුන්වාගන්නා පිරිස් නිරීක්ෂකයාගෙන් තොරව ලෝකය පවතින්නේ ය යැයි කී විට එයින් කියැවෙන්නේ ලෝකය පවතින බව මිනිස් නොවන නිරීක්ෂකයකුගේ හෝ දැනුමක් වන බව ය. මේ මිනිස් නොවන නිරීක්ෂකයා දෙවියන් වහන්සේ මිස අන්කිසිවකු නො වෙයි.

එබැවින් ඊනියා ද්‍රව්‍යවාදීන් වාස්තවිකත්වයක් පිළිබඳ දැනුමක් තමන්ට හෝ අන් අයකුට හෝ ප්‍රකාශකරන විට ඔවුහු දෙවියන් වහන්සේ කෙනකු ගැන උපකල්පනය කරති. මේ ඊනියා වාස්තවිකත්වය, වාස්තවිකව ප්‍රකාශකරන ක්‍රමයක් සකස්කර ගන්නා තෙක් ඔවුන්ට මේ උපකල්පනයකිරීමට සිදුවෙයි. එවැනි ක්‍රමයක් කිසි දිනක සකස්කර ගැනීමට නොහැකි බැවින් මෙයින් කියැවෙන්නේ ඊනියා ද්‍රව්‍යවාදීන් කෙතෙක් එසේ නොවේ යැයි කීව ද ඔවුන්ගේ ලෝකවල ද දෙවියන් වහන්සේ නිරූපද්‍රිතව වාසයකරන බව ය.

කලින් සඳහන්කර ඇති කරුණකින් ගම්‍යවන පරිදි දෙවියන් වහන්සේ කොටස් දෙකකට වර්ගකළ හැකි ය. එක් කොටසක ඇත්තේ ලෝකයෙන් බාහිර වූ දෙවියන් වහන්සේ ය. අනෙක් දෙවියන් වහන්සේ ලෝකය සමග බද්ධ වී ඇත. එනම් එහි දී ලෝකය හා දෙවියන් වහන්සේ යනු දෙකක් නොව එකක් ම බවට පත්වෙයි. පළමු වර්ගයෙහි දෙවියන් වහන්සේ ලෝකයෙන් බාහිරව සිට ලෝකය පවත්නා බව දැන ගනියි. අනෙක් වර්ගයෙහි දෙවියන් වහන්සේ ලෝකය සමග බද්ධ වෙමින්, එනම් තමන් ම ලෝකය බව සලකමින් ලෝකයේ පැවැත්ම පිළිබඳ දැනගනියි. මේ දෙවර්ගයේ ම දෙවියන් වහන්සේ ලෝකය නිර්මානය කරන බව ද අපට වැදගත් වෙයි. පළමු වර්ගයෙහි දෙවියන්

© Prof. Nalin De Silva

වහන්සේ යුදෙව් චින්තනයෙහි හා ඉන්පසු යුදෙව් චින්තනයෙහි බලපෑම ලැබූ කතෝලික චින්තනය, ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය, මුස්ලිම් චින්තනය ආදියෙහි දැකිය හැකි ය. දෙවැනි වර්ගයෙහි දෙවියන් වහන්සේ අපට හමුවන්නේ වෛදික චින්තනයෙහි ය. බ්‍රහ්මන් යනු ලෝකය සමග බද්ධ වූ දෙවියන් වහන්සේ කෙනෙක් ය. වෛදික චින්තනයෙහි ලෝකය යනු බ්‍රහ්මන් ය. එහි ලෝකයෙන් වෙන්වූ බ්‍රහ්මන් කෙනකු නැත.

මේ දැනුම පිළිබඳ තරමක් දීර්ඝ විස්තරය නවතා නැවතත් අවස්ථිති සමුද්දේශ රාමුවලට යෑමට ප්‍රථම සඳහන්කළ යුතු වැදගත් කරුණක් වෙයි. එනම් කිනම් වර්ගයක දෙවියන් වහන්සේ කෙනකු අතින් වුව ද ලෝකය නිර්මානය වන බව ය. ඒ දෙවියන් වහන්සේ ලෝකය නිර්මානයකිරීමට පෙර ලෝකයක් නො වෙයි. ලෝකය පවතින බව දන්නේ, එනම් ඒ පිළිබඳ දැනුමක් ඇත්තේ දෙවියන් වහන්සේට ය. ඊනියා වාස්තවිකත්වයක වුව ද ලෝකය පවතින බව දෙවියන් වහන්සේ දනියි. ඒ දැනුම දෙවියන් වහන්සේට ලැබෙන්නේ ලෝකය නිර්මානය කිරීමෙන් ය. එනම් දෙවියන් වහන්සේ ලෝකය නිර්මානය කර ඒ පිළිබඳ දැනුම ලබයි. එක්තරා ආකාරයකින් ගතහොත් ලෝකය නිර්මානයකිරීම යනු ඒ පිළිබඳ දැනුම ද නිර්මානය කිරීමක් වෙයි. දෙවියන් වහන්සේට වුව ද ලෝකය පවතින්නේ ඒ පිළිබඳ නිර්මානය කරන දැනුමෙහි ය. දෙවියන් වහන්සේට වුව ද ලෝකය පිළිබඳ දැනුමක් නොමැතිව ලෝකය නො පවතියි. ලෝකය පිළිබඳ දැනුම දෙවියන් වහන්සේට සාපේක්ෂ වෙයි. දෙවියන් වහන්සේ ඒ දැනුම නිර්මානය කරයි. නිර්මානාත්මක සාපේක්ෂතාවාදය යනුවෙන් අප විසින් ගොඩනගනු ලැබ ඇති ඥානවිභාගයෙහි ඒ ඒ නිරීක්ෂකයා තම තමන්ට සාපේක්ෂව දැනුම නිර්මානය කරයි. දෙවියන් වහන්සේ ද ලෝකය පැවතීම පිළිබඳ කරුණෙහි දී එසේ කරන බව පෙනීයයි. නිර්මානාත්මක සාපේක්ෂතාවාදයට දෙවියන් වහන්සේ අනවශ්‍ය වෙයි. එහි එකිනෙකා තමතමන්ගේ ලෝක නිර්මානය කරගනියි. එහි ලෝක ගැන මිස ඊනියා ලෝකයක් ගැන නො කියැවෙයි. ලෝකය යනුවෙන් විඥානවාදීන් මෙන්ම ද්‍රව්‍යවාදීන් ද අවසන් විග්‍රහයෙහි දී කියන්නේ දෙවියන් වහන්සේගේ ලෝකයට ය. ඒ දෙවියන් වහන්සේ ලෝකය නිර්මානය කරන්නේ ලෝකය පිළිබඳ දැනුම නිර්මානය කරමින් ය. කවුරුන් කෙසේ කීවත් ඒ ලෝකය දෙවියන් වහන්සේට සාපේක්ෂ වෙයි. එහි ද නිර්මානාත්මක සාපේක්ෂතාවාදයක් වෙයි. නිර්මානාත්මක සාපේක්ෂතාවාදයට දෙවියන් වහන්සේ අනවශ්‍ය වුව ද දෙවියන් වහන්සේට නිර්මානාත්මක සාපේක්ෂතාවාදය අවශ්‍ය වෙයි.

බ්‍රහ්මන් ලෝකය නිර්මානය කරන්නේ ඉන් නො වෙන්වමින් ය. බ්‍රහ්මන් තමන් ද ලෝකය ද නිර්මානය කරයි. නැත්නම් නිර්මානය කරගනියි. එසේ වන්නේ වෛදික චින්තනයෙහි ය. සිදුහත් කුමරු වසර දෙදහස් හයසීයකට පමණ පෙර ඉපදුණු සමයෙහි දඹදිව බටහිර හා මධ්‍ය ප්‍රදේශවල වෛදික චින්තනය පැතිර පැවත්තේ ය. එහෙත් වාසනාවකට ඒ චින්තනය දඹදිව නැගෙනහිර ප්‍රදේශවලට පැතිර තහවුරුවන්නට පෙර සිදුහත් කුමරු ඉපදුනේ ය, එසේ නොවුනේ නම් සිදුහත් කුමරු බුදු නොවී ඇතැම්විට චක්‍රවර්තී රජු බවට පත්වීමට තිබුණි. කෙසේ හෝ වේවා බ්‍රහ්මන් පිළිබඳ දැනුම පැවතියේ වෛදික චින්තනයෙහි ය.

බ්‍රහ්මන් ලෝකය සමග වෙළී සිටිය ද, අනෙක් දෙවියන් වහන්සේ ලෝකයෙන් වෙන් ව වාසය කරයි. ඒ දෙවියන් වහන්සේ යුදෙව් චින්තනයෙහි බිහි වූවෙක් වෙයි. එමෙන් ම යුදෙව් චින්තනය තම පදනමෙහි එක් චින්තනයක් ලෙස ඇති චින්තනවල ද එවැනි දෙවියන් වහන්සේ කෙනෙක් වෙයි. මේ දෙවියන් වහන්සේ ලෝකය නිර්මානය කරන්නේ තමන්ගෙන් බාහිරව ය. ඒ කෙසේ වෙතත් ඒ දෙවියන් වහන්සේ සදාකාලිකව එකම ස්වරූපයෙන් නො පවතින්නේ නම් තමන් වහන්සේ ද නිර්මානය කර ගත යුතු ය. එකම ස්වරූපයෙන් පවතින්නේ යැයි උපකල්පනය කළහොත් ඉන් කියැවෙන්නේ එක්කෝ දෙවියන් වහන්සේ වෙනත් අයකු විසින් නිර්මානය කෙරෙන බව හෝ දෙවියන් වහන්සේ කිසිවකු අතින්වත් නිර්මානය නොවී පවතින බව ය. ඒ කුමක් වුවත් එය සර්වබලධාරී යැයි කියන දෙවිකෙනකුට තරම් නො වෙයි. එබැවින් දෙවියන් වහන්සේගේ ද ගෞරවය ආරක්ෂාවන අයුරින් කළහැකි වඩා සුදුසුම උපකල්පනය වනුයේ දෙවියන් වහන්සේ තමන් වහන්සේ ම නිර්මානය කරගන්නා බව ය.

එහෙත් එහි දී සිදුවන්නේ බ්‍රහ්මන්ගේ වැනි නිර්මානයක් නොවන බව ද පැහැදිලි ය. එයට හේතුව බ්‍රහ්මන් තමා ද ලෝකය ද එකක්වන අයුරින් නිර්මානය කිරීමත් යුදෙව් හා ඒ ආශ්‍රිත දෙවියන් වහන්සේ තමන් පළමුවෙන් නිර්මානයකර පසුව ලෝකය තමන්ගෙන් බාහිරව නිර්මානය කිරීමත් ය. ඒ කුමක් වුව ද පැහැදිලි කරුණ නම් දෙවියන් වහන්සේට තමන් වහන්සේ පිළිබඳ දැනුමක් ඇති බව ය. එනම් දෙවියන් වහන්සේට විඥානයක් ඇති බව ය. තමන් වහන්සේ පවතින බව, ජීවත්වන බව දෙවියන් වහන්සේ දනියි. ඒ තමන් වහන්සේ පිළිබඳ දැනුම ය. මෙයින් ද

© Prof. Nalin De Silva

කියැවෙන්නේ දෙවියන් වහන්සේ තමන් වහන්සේ නිර්මානය කරන්නේ තමන් වහන්සේ පිළිබඳ දැනුමත් සමග බව ය. කිනම් වර්ගයක දෙවියන් වහන්සේ කෙනකු ගත්ත ද, දෙවියන් වහන්සේ මූලික කාර්යය ලෙස තමන් වහන්සේ පිළිබඳ දැනුම නිර්මානය කර තමන් වහන්සේ පිළිබඳ සවිඥානික වන බව පැහැදිලි ය.

නිර්මානාත්මක සාපේක්ෂතාවාදයෙහි සියල්ලෝ ම පළමුව තම තමන් නිර්මානය කර ගනිති. මම යන්න නිර්මානය නොකර අපට කිසිවක් කළ නො හැකි ය. නිර්මානාත්මක සාපේක්ෂතාවාදයෙහි දී දෙවියන් වහන්සේ ඇතුළු සවිඥානික යැයි කිවහැකි සියළු සත්ත්වයන් පළමුව කරන්නේ තමා නිර්මානය කරගැනීම ය. තමා නිර්ණය කෙරෙන්නේ අනෙකාට සාපේක්ෂව අනෙකා විසින් ය යන පශ්චාත්නූතනවාදී මතය මෙහි දී ප්‍රතික්ෂෙප කෙරෙයි. පශ්චාත්නූතනවාදී මතය ද ගලාඑන්නේ අප බාහිර දෙවියන් වහන්සේ අතින් නිර්මානය වන්නේ ය යන චින්තනයෙහි ය. අපට ඇති අපේම පැවැත්මක් ගැන සිතාගැනීමට බටහිරයන්ට නො හැකි ය. බටහිර විඥානවාදියෝ ඒ පැවැත්ම නිර්මාණය කිරීම දෙවියන් වහන්සේට පවරති. ඊනියා ද්‍රව්‍යවාදියෝ පැවැත්ම ද්‍රව්‍යයට හා ආර්ථිකයට පවරති. පශ්චාත්නූතනවාදියෝ අනෙකාට පවරති. මතුපිටින් වෙනස් දෑ කීව ද මේ සියල්ලන් ම කියන්නේ අපේ පැවැත්ම බාහිරව තීරණය කෙරෙන බව ය.

අනෙක් අය හේතුවෙන් අපේ චරිත වෙනස්වන බව පැහැදිලි ය. එහෙත් සත්ත්වයාට විඥානයක් ලබාදෙන්නේ අනෙකකු නොව තමා ම ය. අප විසින් කලකට පෙර සිංහල බෞද්ධ මනස මැයෙන් ලියන ලද ලිපියක මනස විසින් මනස නිර්මානය කෙරෙන අන්දම ගැන විස්තරයක් කෙරී ඇත. මනස, එලෙස මනස නිර්මානය කිරීමෙන් පසු අනෙක් දැනුම් නිර්මානය කරයි. ඒ අර්ථයෙන් ගත්කල අපි සියල්ලෝම දෙවියන් වහන්සේලා බ්‍රහ්මන්ලා වන්නෙමු. පළමුව අප නිර්මානය කරන අපි පසුව අනෙක් දෑ නිර්මානය කරන්නෙමු. මෙයින් පැහැදිලිකිරීමට බලාපොරොත්තු වූයේ අන් කිසිවක් නොව දැනුම නිර්මානයේ දී සවිඥානික නිරීක්ෂකයාගේ ඇති වැදගත්කම ය. නිරීක්ෂකයන් නොමැතිව දැනුමක් නැත. එහෙත් බටහිර විද්‍යාව මේ නිරීක්ෂකයන් ඇති වන්නේ කෙසේ ද යන්න තේරුම් නොකරයි. එහි නිරීක්ෂකයෝ උපකල්පනය කෙරෙති. ඒ බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ප්‍රධාන නිරීක්ෂකයා වූ දෙවියන් වහන්සේ උපකල්පනය කෙරෙන පරිදි ය. එහෙත් සිංහල බෞද්ධයනට දෙවියන් වහන්සේ පමණක් නොව සියළු සවිඥානික සත්ත්වයෝ ම තම තමන්ගේ නිර්මාන වෙති. සිංහල බෞද්ධ විද්‍යාවක නිරීක්ෂකයා නොමැතිව දැනුමක් නොමැතිවා පමණක් නො වෙයි. දැනුම ද නිරීක්ෂකයා ද නිරීක්ෂකයාගේ ම නිර්මාන වෙයි ~

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva